# *නව යොවුන්වියේ ජංගම දුරකථන භාවිතය සහ අධ්‍යාපනය (බලංගොඩ ප්‍රදේශය ඇසුරින්)*

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**ගමගේ ධනංජන** [1]

---


**සංක්ෂේපය**

යොවුන් කාලය තුළ දී යොවුන් දරුවන් අධ්‍යාපනයට ලබා දෙනුයේ අඩු වටිනාකමක් වන අතර විශේෂයෙන් ම සමාජ වෙනස් වීමත් සමඟ නූතන තාක්ෂණික උපකරණ භාවිතයට මොවුන් පෙළඹී ඇත. නව යොවුන් වියේ පසුවන්නන් ජංගම දුරකථන භාවිත කිරීම ඔවුන්ගේ අධ්‍යාපනයට අයහපත් අන්දමින් බලපාන්නේ යැයි සමාජය විසින් අද වන විට පිළිගෙන ඇත.  මෙම පර්යේෂණයේ දී අධ්‍යයනය කිරීමට නියමිත වූ කේන්ද්‍රීය ගැටලුව වූයේ නව යොවුන් වියේ ජංගම දුරකතන භාවිතය ඔවුන්ගේ අධ්‍යාපනයට කරනු ලබන බලපෑමේ ස්වභාවය කෙබඳුද? යන්න පිළිබඳ අධ්‍යයනය කිරීමයි. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ නව යොවුන්වියේ ජංගම දුරකතන භාවිතය ඔවුන්ගේ අධ්‍යාපනයට බලපා තිබෙන ආකාරය පිළිබඳව දැනට අප සතුව තිබෙන දැනුමට නව දැනුම් එකතුවක් සිදු  කිරීමයි. ජංගම දුරකථන භාවිතය නව යොවුන්වියේ දරුවන්ගේ අධ්‍යාපනයට උදව් වන්නේ කෙසේද, එමගින් ඔවුන්ගේ දැනුම වර්ධනය කර ගැනීම සඳහා දායක කර ගනු ලබන්නේ කෙසේද, ජංගම දුරකථන භාවිතයෙන් ඇති වන අයහපත් ප්‍රතිඵල වළක්වා ගන්නේ කෙසේද යන්න පිළිබඳ අධ්‍යයනය කිරීම අනෙකුත් සෙසු අරමුණු විය. පර්යේෂණය සිදු කිරීම සඳහා ප්‍රත්‍යක්ෂමූලවාදී විධික්‍රම (Positivism) යටතේ ප්‍රශ්නාවලී ක්‍රමය හා සම්මුඛ සාකච්ඡා සිදු කිරීම මඟින් ප්‍රාථමික දත්තයන් ලබා ගන්නා ලදි. දත්තයන් විශ්ලේෂණය කිරීම සඳහා spss නම් වන පරිගනක මෘදුකාංගය භාවිත කරන ලදි. මේ ආකාරයට සිදු කරන ලද අධ්‍යයනයෙන් අනතුරුව නිගමන රැසකට ද එළඹිය හැකි විය. එනම්, නව යොවුන් පිරිස ජංගම දුරකතනයන් භාවිත කරනු ලබන්නේ ස්වයං පාලනයකින් තොරවය, නව යොවුන් පිරිස ජංගම දුරකථන භාවිතය හේතුවෙන් මානසික,  සෞඛ්‍ය, ආර්ථික, අධ්‍යාපන ගැටලුවලට බහුලව ගොදුරු ව ඇත, යෞවන යෞවනියන්ගේ ජංගම දුරකතන භාවිතය පිළිබඳ දෙමාපියන් සැලකිලිමත් වන්නේ අවම වශයෙනි. අධ්‍යයනයෙන් පසු කළ හැකි යෝජනා අතර දෙමාපිය සැලකිල්ල හා අවධානය යොවුන් පිරිසට ලැබීම වැදගත් වීම, යොවුන් වියේ දී ඇති වන ගැටලු පිළිබඳ දැනුවත් කිරීම, ස්වයං පාලනයකින් යුක්තව ජංගම දුරකතන භාවිතයට යොවුන් පිරිස යොමු කිරීම ආදිය කළ යුතුව ඇත.  සංක්ෂේපන විධි (key words) ලෙස,

1 fb= facebook 2 mms= multi media service 3 sms= short message service දැක්විය හැකිය.


---

*1. සමාජ විද්‍යාව, සමාජ විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*